## 28

ළමා අපෙන් ඔබට පිදෙන
යාගය සමිඳේ පිළිගන්න
මල් පලතුරු නැහැ දැල්වූ පහන් නැහැ
නොකිලිටි අපෙ සිත් පිළිගන්න
අසරණයන් තුළ ඔබ හඳුනා ගෙන
අප කළ යහපත පිළිගන්න
නිරතුරු ඔබගේ කැඩපත් වෙමු සමිඳේ //

අළුත්ම පැන්සල දෙකට කඩා ලියන්න දුන්නේ
අඟලක පැන්සල මෙතෙක් ලියූ එය විසි කෙරුවේ
සතුටු සිනාවකි ඉම්හිරියාවකි පහළ වුනේ
ඔබවයි සමිඳුනි මා දුටුවේ ඇයගේ මුවේ

පේර කෝට්ටුවෙන් රිම් එළවනු දැක "බ්‍රෑම්" කියා
පැලේ ගෙදර දුප්පත් පොඩි දරුවා වැව් බැම්මේ
දිළිසෙන අළුත්ම බයිසිකලේ මගේ ඔහුව තියා
සතුටු අනන්තෙට ඉගිළ ගියා අපි එක පිම්මේ

